# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය<br>எனது இல.<br>My No.

ඔබේ අංකය<br>உமது இல.<br>Your No.

දිනය<br>திகதி<br>Date. 2026.08.10

ඒ. අශෝකා පද්මිණී
අඹකැලේ උතුර,
පල්ලම.

පැමිණිලිකාර පාර්ශවය

ඒ.එම්. උමිඳු පේෂල

වින්දිත පාර්ශවය

1. බී.ඒ. පැතුම් සඳරුවන්
   ක්‍රීඩා භාර ආචාර්ය,
   හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ
   විද්‍යාලය, නල්ලදරන්කට්ටුව.
   (වර්තමාන සේවා ස්ථානය: හලා/ආර/
   මහමාඑළිය කනිෂ්ඨ විද්‍යාලය)

2. සමන් පුෂ්පකුමාර
   විදුහල්පති (හිටපු)
   හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ
   විද්‍යාලය, නල්ලදරන්කට්ටුව.
   (වර්තමාන සේවා ස්ථානය: හලා/ආර/
   මහමාඑළිය කනිෂ්ඨ විද්‍යාලය)

වගඋත්තරකාර පාර්ශවය

**පැමිණිලි අංකය:- HRC/3349/24**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාර ඒ. අශෝකා පද්මිණී යන අය විසින් 2024.07.31 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තම පුතා වන ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන අය හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත්, ඔහු එම පාසලේ උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා ද වන බවත්, 2024.07.29 වන දින පාසලේ පෙරවරුවේ පැවැති රැස්වීමට සහභාගි වී තම පුතා පන්තිය වෙත

යමින් සිටියදී එම පාසලේ ක්‍රීඩා භාරව සිටි බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් තම පුතාට අඩගසා "උඹේ කොණ්ඩය වැඩියි" කියා කනට පහරවල් දෙකක් තදින් ගසා ඇති බවත් ය. පසුව තම පුතා කනෙහි වේදනාව දරාගෙන පාසලේ ඉගෙනුම් කටයුතු ද අවසන් කර නිවසට පැමිණ තමා හට අදාළ සිදුවීම සම්බන්ධයෙන් දැනුම් දුන් බවත්, එවිට තම පුතා හට දරුණු ලෙස පහරදීමක් සිදු වූ බව තමා දැනුවත්ව නොසිටි බැවින්, "කමක් නෑ පුතේ, ගුරුවරයෙක්නේ දඬුවම් කළේ" යැයි පවසා තම පුතාගේ කනෙහි කැක්කුමක් තිබූ බැවින් ඔහුට පැනඩෝල් දෙකක් බීමට දුන් බවත්, පසුව තම පුතා නින්දට ගිය බවත්, එලෙස නින්දට ගොස් රාත්‍රී 10.30ට පමණ තම පුතා අවදි වී "අම්මේ කන කකියනවා, කනේ මොකෙක් හරි යනවා වගේ තේරෙනවා" යනුවෙන් පැවසූ බවත්, එවිට තමා ටෝර්ච් එක ගසා කන බැලූ බවත්, එවිට තම පුතාගේ කනෙන් ලේ වහනය වන බව දුටු බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, තමා 1990 දරන ක්ෂණික ඇමතුම් අංකයට කතාකර ගිලන් රථයක් ගෙන්වා ගෙන තම පුතා හලාවත දිස්ත්‍රික් මහ රෝහල වෙත ඇතුළත් කළ බවත්, එම රෝහලේදී රෝහල් පොලීසිය විසින් තම පුතාගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන තිබෙන බවත්, තම පුතාගේ කන් අඩිය පැලී ඇති බව වෛද්‍යවරුන් පවසා සිටි බවත්, තම පුතාට සිදු වූ පහරදීම හේතු කොටගෙන ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුව ඇති බැවින් මෙ සම්බන්ධයෙන් කඩිනමින් සොයා බලා සාධාරණයක් ඉටුකර දෙන ලෙස පැමිණිලිකාරිය මෙම පැමිණිල්ල තුළින් ඉල්ලා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අයගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා 2025.02.25 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පුත්තලම උපකාර්යාලයේ දී සිදු කරන ලද පරීක්ෂණයේ දී 1 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, තමා 2020.01.02 වන දින සිට හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා පුහුණු ගුරුවරයකු වශයෙන් සේවය කළ බවත්, 2024.07.29 වන දින එම පාසලේ උදේ රැස්වීමෙන් පසු ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන ශිෂ්‍යයා පාසලට නොගැලපෙන ලෙස කොණ්ඩය කැපීම සම්බන්ධව එම ශිෂ්‍යයා හට උපදෙස් ලබාදෙන අවස්ථාවේදී තමා සමඟ එකඟතාවයක් නොවන ආකාරයෙන් එම ශිෂ්‍යයා හැසිරුනු අවස්ථාවේදී තමා විසින් එම ශිෂ්‍යයාගේ කනට පහරක් එල්ල කළ බවත් ය. ඉන්පසු එම ශිෂ්‍යයා එදින අදාළ පාසල් වැඩ කටයුතු නිසියාකාරව සිදුකළ බවත්, පසුව එම ශිෂ්‍යයා රෝහල් ගතවූ බව පසුදින උදෑසන පණිවිඩයක් මාර්ගයෙන් දැනගත් අතර, ඉන්පසු තමා එම ශිෂ්‍යයා බැලීමට කිහිප වරක් උත්සාහ කළ නමුත්, එම උත්සාහය අසාර්ථක වූ බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් හලාවත මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී1401/24 දරණ නඩුව විභාග වන බවත් 1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**2 වන වගඋත්තරකාර හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ විද්‍යාලයේ හිටපු විදුහල්පති සමන් පුෂ්පකුමාර යන අයගේ කරුණු දැක්වීම.**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකාර හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ විද්‍යාලයේ හිටපු විදුහල්පති සමන් පුෂ්පකුමාර යන අය 2026.03.26 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පුත්තලම උපකාර්යාලයට කැඳවා ප්‍රකාශයක් ලබාගෙන ඇත. එහිදී 2 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, තමා 2024.02.06 වන දින හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති වශයෙන් රාජකාරී භාරගත් බවත්, 2026.02.06 වන දින සිට සේවා අවශ්‍යතාවය මත හලා/ආර/මහමාළිය කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් සේවය කරමින් සිටින බවත් ය. තමා හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති වශයෙන් සේවය කරමින් සිටියදී 2024.07.29 වන දින උදෑසන රැස්වීම අවසන් කිරීමෙන් අනතුරුව තමා විදුහල්පති කාර්යාලයේ රාජකාරි කරමින් සිටියේදී එම පාසලේ ක්‍රීඩා භාර ගුරුවරයා වශයෙන් සේවය කරන බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා "ළමයින්ගේ කොණ්ඩ වැඩියි" යනුවෙන් සඳහන් කළ නමුත්, එම අවස්ථාවේදී මෙම පහරදීම සම්බන්ධ දැන නොසිටි බවත්, ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන ශිෂ්‍යයාගේ මව තමා හට දුරකථන ඇමතුමක් ලබා දී බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් ඇයගේ පුතාට පහර දුන් බව කියා සිටීමෙන් පසුව මෙම පහරදීම සම්බන්ධව දැනුවත් වූ බවත්, ඉන්පසු 2024.07.30 වන දින ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන ශිෂ්‍යයා හලාවත දිස්ත්‍රික් රෝහලට ඇතුළත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන බව දැනගැනීමෙන් අනතුරුව තමා විසින් සියලු ගුරුවරුන් කැඳවා පාසල් දරුවන්ට දඬුවම් දීමේ දී ශාරීරික සහ මානසික වධහිංසා ලබා නොදීම සම්බන්ධව සැලකිලිමත් විය යුතු බව පැහැදිලි කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එසේම, මෙම පහරදීම සම්බන්ධව ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන ශිෂ්‍යයාගේ දෙමව්පියන් විසින් වාචිකව ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අනුව තමා මෙම සිද්ධිය පිළිබඳව පාසලේ ලොග් සටහනට ඇතුලත් කළ බවත්, එම පහරදීම සම්බන්ධව හලාවත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත දුරකථනය මගින් දැනුවත් කිරීමෙන් අනතුරුව හලාවත කලාප අධ්‍යාපන කාර්යාලය මගින් වහාම ක්‍රියාත්මක වන පරිදි බී.ඒ. පැතුම් සඳරුවන් ගුරුවරයා වෙනත් පාසලක් වෙත අනුයුක්ත කරන ලද බවත් 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. පසුව මෙම පහර දීම සම්බන්ධව වයඹ පළාත් අධ්‍යාපන කාර්යාලය විසින් ද පරීක්ෂණයක් සිදු කරන ලද බවත්, එකී පරීක්ෂණය සඳහා නිලධාරීන් පාසල වෙත පැමිණි අවස්ථාවේ දී ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන ශිෂ්‍යයා හට පහරදුන් බවට චෝදනා ලැබූ බී.ඒ. පැතුම් සඳරුවන් ගුරුවරයා ද හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයට ගෙන්වා වයඹ පළාත් අධ්‍යාපන කාර්යාලයේ සිට පැමිණි නිලධාරින් විසින් ඔහු හට අවවාද කර ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද, මෙම බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයාට එරෙහිව මීට පෙර කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බවත්, කෙසේ වෙතත් මෙම සිද්ධියෙන් පසුව ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන ශිෂ්‍යයාගේ අධ්‍යාපන සහ පාසල් කටයුතුවලට කිසිදු බාධාවක් නොමැති කරගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් තවදුරටත් සඳහන් කරන ඇත.

<u>නිරීක්ෂණ</u>

මෙම පැමිණිල්ලේ පැමිණිකාරියගේ පුතා වන ඒ. එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවා මේ වන විට හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම් කටයුතු සිදුකරන බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් ප්‍රකාශකර සිටින්නේ, පැමිණිකාරියගේ පුතා වන ඒ. එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන වයස අවුරුදු 16ක් වන දරුවාගේ කනට, හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් 2024.07.29 වන දින පාසලේ දී පහරදීමක් සිදුකර ඇති බවත්, එකී පහරදීම හේතුවෙන් තම පුතාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුව ඇති බවත් ය.

එසේම, 2024.07.29 වන දින පැමිණිලිකාරියගේ පුතා වන වන ඒ. එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවා පාසලට නොගැලපෙන ලෙස කොණ්ඩය කැපීම සම්බන්ධව එම දරුවා හට උපදෙස් ලබාදෙන අවස්ථාවේදී තමා සමඟ එකඟතාවයක් නොවන ආකාරයෙන් එකට එක කියමින් එම දරුවා හැසිරුනු බැවින් තමා විසින් එම දරුවාගේ කනට පහරක් එල්ල කළ බව හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භාර ගුරුවරයා ලෙස කටයුතු කළ 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් විසින් කොමිෂන් සභාව හමුවේ පිළිගෙන ඇත.

මෙම පහරදීම සම්බන්ධයෙන් 2024.07.29 වන දින සවස පැමිණිලිකාරිය විසින් එවකට හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් සේවය කළ 2 වන වගඋත්තරකාර සමන් පුෂ්පකුමාර යන අය වෙත දුරකථන මාර්ගයෙන් දැනුම්වත් කර ඇති බවත්, ඊට පසුදින 2 වන වගඋත්තරකරු විසින් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඒ. එම්. උමිඳු පේෂල යන ශිෂ්‍යයාගේ දෙමව්පියන් වෙතින් තොරතුරු ලබාගෙන ඇති බවත්, 2 වන වගඋත්තරකරු විසින් මෙම පහරදීමට අදාළ තොරතුරු පාසලේ ලොග් සටහනට ඇතුළත් කර හලාවත කළාප අධ්‍යාපන කාර්යාලය ද දැනුම්වත් කර ඇති බවත්, ඒ අනුව හලාවත කළාප අධ්‍යාපන කාර්යාලය මගින් 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය වෙනත් පාසලක් වෙත මාරු කර ඇති බවත්, මෙම පහරදීමට අදාළව වයඹ පළාත් අධ්‍යාපන කාර්යාලය මගින් ද පරීක්ෂණයක් පවත්වා 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය හට අවවාද කර ඇති බවත් ඉදිරිපත්ව ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකාරිය සිය පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තම පුතා වන ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවාට සිදුකළ පහර දීම සම්බන්ධයෙන් ආරච්චිකට්ටුව පොලිස් ස්ථානය මගින් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවයි. එහෙත් මෙම පහර දීම සම්බන්ධව ආරච්චිකට්ටුව පොලිස් ස්ථානය මගින් 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය අත්අඩංගුවට ගෙන ඇති බවත්, CIB I 198/214 යටතේ 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය වෙතින් ප්‍රකාශයක් සටහන් කර ආරච්චිකට්ටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් මෙම පහරදීම් සම්බන්ධව හලාවත ගරු දිසා/මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක බී1401/24 යටතේ කරුණු වාර්තා කර ඇති බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඒ. එම්. උමිඳු පේෂල යන දරුවාට 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් සිදුකළ පහර දීම සම්බන්ධයෙන් ආරච්චිකට්ටුව පොලිස් ස්ථානය මගින් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව පෙනී යයි.

පැමිණිලිකාරියගේ පුතා වන ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවාට 2024.07.29 වන දින උදෑසන සිදු වූ පහරදීමෙන් පසුව ද, එම දරුවා එදින පාසලේ රැඳී සිට ඇති බව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ. කෙසේවෙතත් පැවති වේදනාත්මක තත්ත්වය හේතුවෙන් එදින පාසලේ රැඳී සිටිය ද තමා හට අධ්‍යාපන කටයුතු නිසියාකාරව සිදු කරගැනීමට නොහැකි වූ බව වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා විසින් 2025.05.22 වන දින කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

එසේම, එම පහර දීම සිදු වූ 2024.07.29 වන දින රාත්‍රී 10.30ට පමණ ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවාට ඇති වූ කනෙහි වේදනාව අධික වීම හේතුවෙන් එම වින්දිත දරුවා 2024.07.30 වන දින රාත්‍රී 12.13ට හලාවත දිස්ත්‍රික් මහ රෝහලට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඇතුළත් කර ඇති බවත්, එදිනම පෙ.ව. 11.45ට අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් එම වින්දිත දරුවා පරීක්ෂා කර ඇති බවත් අංක 973/2024 සහ 2024.07.30 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පෙනී යයි.

එකී අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය යන්න පහත පරිදි සටහන් කර ඇත.

"<u>දරුවාගේ ප්‍රකාශය-</u>

'මම ඉගෙන ගන්නේ ඉහළ අත්තංගනය රජයේ (කණිෂ්ඨ) පාසලේ 11 ශ්‍රේණියේ. 2024 ජූලි 29 වෙනිදා උදේ 8.30ට විතර ඉස්කෝලේ ග්‍රවුන්ඩ් එකේ ඉන්නකොට ක්‍රීඩා උගන්වන සර් මගේ වම් කනට පාරවල් දෙකක් ගැහුවා. මගේ කොණ්ඩේ හරියට කපලා තිබුණේ නෑ කියලයි මට ගැහුවේ. සර්ගේ නම පැතුම් සඳරුවන්. ගැහුවට පස්සේ මගේ කන ඇහෙන එක අඩු වුණා. ගෙදර ආවම

කනෙන් ලේ ආවා. සර් මට මීට කලිනුත් 2023 දෙසැම්බර් මාසෙ දවසක ඉදල් මිටකින් මාගේ පස්සට ගහලා තියෙනවා.'

<u>මවගේ ප්‍රකාශය-</u>

'පුතාව හලාවත ඉස්පිරිතාලෙන් ටිකට් කපලා 2024.07.30 ගෙදර අරගෙන ගියාට පස්සේ ආපහු කන රිදෙන්න ගත්තා. උණ ගැනිලා කනෙන් සැරව එන නිසා 2024.08.01 කුලියාපිටිය ඉස්පිරිතාලෙට ගෙනිච්චා. බෙහෙත් ගත්තා. ආපහු 2024.08.05 කුලියාපිටිය ඉස්පිරිතාලෙන් බෙහෙත් කළා. පස්සේ හලාවත උගුර කන නාසය සායනට සති දෙකකට පස්සේ ගෙනත් පෙන්නුවා. දරුවට මේ සිද්ධියෙන් පස්සේ නිතරම ඔලුවේ කැක්කුම කැරකිල්ල තිබුන නිසා මාසයක විතර කාලයක් ඉස්කෝලේ යන්න බැරි වුණා.'"

එසේම, අධිකරණ වෛද්‍යවරයා විසින් ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව 'තුවාල' යන කොටසේ පහත පරිදි සටහන් කර ඇත.

"**<u>Injuries</u>**

1. Traumatic perforation of the tympanic membrane of left side ear."

එසේම, එකී ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවාගේ වම් කනෙහි ඇති තුවාලය, මොට ආයුධයක් මගින් සිදු කර ඇති බරපතල තුවාලයක් බව අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් සඳහන් කර ඇත.

තවද, අධිකරණ වෛද්‍යවරයා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, රෝගියාගේ ප්‍රතිකාර ලබාගැනීමට අදළ වාර්තාවන්ට අනුව එම වින්දිත දරුවාගේ වම් කනෙන් ඇතිවූ වේදනාව, කන් අඩියේ සිට දිය වගේ යමක් පිටතල ගලා ඒම සහ උණ වැනි රෝග ලක්ෂණ හේතුවෙන් මෙම සිද්ධියෙන් පසුව දෙවරක් එනම්, 2024.08.01 හා 2024.08.05 වන දිනවලදී ප්‍රතිකාර ගැනීම සඳහා කුලියාපිටිය ශික්ෂණ රෝහල වෙත ඇතුළත් කර ඇති බවත්, වින්දිත දරුවාගේ මව ප්‍රකාශ කර සිටින පරිදි මෙම පහරදීමෙන් පසුව නිතර නිතර හිසේ ඇති වූ වේදනාව සහ කනේ ඇති වූ වේදනාව හේතුවෙන් මාසයක පමණ කාලයක් වින්දිත දරුවා පාසල වෙත නොගොස් සිටි බවයි.

පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තාවන්ට අනුව ද මෙම පහරදීමෙන් පසු වින්දිත දරුවාගේ වම් කනේ ඇතිවූ වේදනාව හේතුවෙන් එම වින්දිත දරුවා නැවත 2024.08.01 වැනි දින හා 2024.08.05 වන දින කුලියාපිටිය ශික්ෂණ රෝහලින් ප්‍රතිකාර ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

ඉහතින් දක්වා ඇති පරිදි පැමිණිලිකාරියගේ පුතා වන ඒ.එම්. උමිඳු පේෂල (මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය) යන දරුවාට 2024.07.29 වන දින හලා/ආර/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා භාර ගුරුවරයා ලෙස සේවය කළ 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් පහර දීමක් සිදු කර ඇති බවත්, ආරච්චිකටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් මෙම පහරදීම පිළිබඳව ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් අනතුරුව හලාවත ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇති බවත් පෙනී යයි.

මෙවැනි වධහිංසාවන්ට පත්වීම සම්බන්ධ පැමිණිලි වලදී වැදගත්ම සාධකයක් වන්නේ වෛද්‍ය වාර්තාවන් ය. ඒ බව **<u>ඩබ්. නන්දසේන එ. යූ.ජී. චන්ද්‍රදාස, ස්ථානාධිපති, පොලිස් ස්ථානය, හිනිදුම සහ තවත් අය</u>** [(2005) B.L.R. 104] නඩුවේ දී ශිරාණි බණ්ඩාරනායක විනිසුරුතුමිය විසින් සඳහන් කර ඇත. (*"…when there is an allegation based on violation of fundamental rights guaranteed in terms of Article 11 of the Constitution, it would be necessary for the petitioner to prove his position by way of medical evidence and/or by way of affidavits and for such purpose it would be essential for the petitioner to bring forward such documents with a high degree of certainty for the purpose of discharging his burden."*)

ඒ අනුව වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවාගේ අංක 973/24 සහ 2024.07.30 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව මෙම වින්දිත දරුවාගේ වම් කනට බරපතළ තුවාලයක් සිදු වී ඇති බව තහවුරු වේ. මෙම අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ එකී තුවාලය රෝගියා විසින්, ඔහුගේ වම් කනට 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් පහරදීමක් සිදු කරන ලද බවට ලබාදෙන ලද ඉතිහාසය සමඟ ගැළපෙන බවට සඳහන් කර නොමැති වුවද, එකී ඉතිහාසය බැහැර කිරීමක් ද අධිකරණ වෛද්‍යවරයා විසින් සිදු කර නොමැත. කෙසේවෙතත් 2024.07.29 වන දින පාසලේ දී වින්දිත දරුවාගේ කනට තමා විසින් පහරදීමක් සිදු කළ බවට 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් පිළිගෙන ඇත. එසේම, එදින සවස 4 පමණ වන තුරු පාසලේ අමතර පන්ති පැවැත්වුණු බැවින් වින්දිත දරුවා පාසලේ රැඳී සිටි බව 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත.

එසේම, වින්දිත දරුවා නිවසට ගොස් ඔහුගේ මව හට එකී පහරදීම පිළිබඳව දැනුම්දීමෙන් අනතුරුව ඇය විසින් 2 වන වගඋත්තරකාර හලා/ආර/ අත්තන්ගනය කනිෂ්ඨ විද්‍යාලයේ හිටපු විදුහල්පති සමන් පුෂ්පකුමාර යන අය හට දුරකථන මාර්ගයෙන් ඒ පිළිබඳව දැනුම් දුන් බව 2 වන වගඋත්තරකරු විසින් ද ප්‍රකාශ කර ඇත. එසේම, අදාළ පහරදීම සිදු වූ 2024.07.29 වන දිනට පසුදින එනම්, 2024.07.30 වන දින රාත්‍රී 12.13ට වින්දිත දරුවා හලාවත දිස්ත්‍රික් මහ රෝහලට ඇතුළත්ව ඇති බවට වෛද්‍ය වාර්තාවන්හි සඳහන්ව ඇති බැවින් 2024.07.29 වන දින රාත්‍රී 10.30ට පමණ වින්දිත දරුවාගේ කනෙහි වේදනාව අධික වීම හේතුවෙන් එදින රාත්‍රියේම රෝහල්ගත වූ බවට වන පැමිණිලිකාරියගේ

ප්‍රකාශය පිළිගත හැකි බව ද නිරීක්ෂණය වේ. ඒ අනුව 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා විසින් සිදු කරන ලද පහරදීම් හේතුවෙන් වින්දිත දරුවාගේ කනෙහි බරපතළ තුවාල තත්ත්වයක් සිදුව ඇති බව තහවුරු වේ.

එසේම, මෙම සිදුවීමට යම් සමානතාවයක් සහිත සිදුවීමක දී පාසල් දරුවෙකුට වම් අතට, වම් කන ප්‍රදේශයට සහ පසුපස පහළ ප්‍රදේශයට වගඋත්තරකාර පාසලේ විදුහල්පතිවරයා, නියෝජ්‍ය විදුහල්පතිවරයා සහ ගුරුවරයෙකු විසින් සිදු කළ පහරදීමකට අදාළව **බණ්ඩාර එ. වික්‍රමසිංහ** [(1995) 2 Sri L.R. 167] නඩුවේ දී, කුලතුංග විනිසුරුතුමා විසින් සඳහන් කර ඇත්තේ, එම පහරදීම්, පාසලේ විනය පවත්වාගෙන යාමට වගඋත්තරකරුවන් වෙත පවතින බලය ඉක්මවා යාමක් වන බවත්, ඒ තුළින් , 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති අයිතිවාසිකම උල්ලංඝණය වන බවත් ය. (*"Objectively viewed the assault on the petitioner by the respondents was in excess of disciplinary power and violative of rights under Article 11."*)

එසේ හෙයින් 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා හට සිදු කරන ලද පහරදීම හේතුවෙන් එකී දරුවා හිංසනයකට පත්ව ඇති බව වෛද්‍ය වාර්තා අනුව තහවුරු වන බැවින්, ඉහත නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට වන වින්දිත පාර්ශවය වන එම්. ඒ.එම්. උමිඳු පේෂල යන දරුවාගේ මූලික අයිතිවාසිකම, 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ අන්තර්ගත ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාවට අනුව, ගුරුවරුන් යනු ශිෂ්‍යයින්ගේ 'ස්ථානීය දෙමාපියන්' (Loco-Parents) යන නෛතික සංකල්පයට අනුව සිසුන්ගේ සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීමට ගුරුවරුන් බැඳී සිටින බව එහි පැහැදිලිව දක්වා ඇත. එසේම, එහි 5.3 (අ) වගන්තිය අනුව ගුරුවරයෙකු විසින් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (1989) ප්‍රකාරව ළමයින් සතු අයිතීන් (විශේෂයෙන් අධ්‍යාපනය ඇතුළුව) තහවුරු වන සේ කටයුතු කළ යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි ඇතුළත් සියලු අයිතිවාසිකම් දරුවන් වෙත සුරක්ෂිත කරදීමට ගුරුවරුන් විසින් කටයුතු කිරීම එකී චක්‍රලේඛ ප්‍රතිපාදනය මගින් අපේක්ෂිත ය. 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 37(අ) වගන්තිය මගින් දක්වා ඇත්තේ කිසිම ළමයෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එබැවින් ඉහත කී අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ 5.3 (අ) වගන්තිය ප්‍රකාරව එකී අයිතිවාසිකම සුරක්ෂිත වන අයුරින් ගුරුවරුන් විසින්

කටයුතු කළ යුතු ය. එහෙත් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා හට 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් පහරදීමක් සිදු කර ඇති බව තහවුරු වී ඇත. ඒ අනුව 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය ගුරුවරයෙකු වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ අන්තර්ගත ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාවට අනුව කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ හේතුවෙන් වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා හට නීතිය මගින් සුරක්ෂිත ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවකාශය අහිමි වී ඇති බව ද පෙනී යයි.

ඉහත කරුණු අනුව සලකා බැලීමේ දී 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය ගුරුවරයෙකු ලෙස අනුගමනය කළ යුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2012/37 දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා හට නීතිය මගින් සුරක්ෂිත ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවකාශය අහිමි වී ඇති බැවින්, 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම ද නීතිය ක්‍රියාත්මක කිරීම ද සැම දෙනාටම එක හා සමාන විය යුතු බවට වන වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවාගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

2 වන වගඋත්තරකාර හලා/ආර්/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ හිටපු විදුහල්පති සමන් පුෂ්පකුමාර යන අය විසින් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා සහ 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා සමඟ ඇති වූ ගැටලුකාරී තත්ත්වය හමුවේ ඒ පිළිබඳව විමසා බලා කලාප අධ්‍යාපන කාර්යාලය දැනුම්වත් කර ඇති බැවින් ද, එම දැනුම් දීම මත 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන ගුරුවරයා වෙනත් පාසලකට මාරු කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලය විසින් කටයුතු කර ඇති බැවින් ද, මෙම සිදුවීමෙන් පසුව දරුවන් හට දඬුවම් ලබා දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධව විද්‍යාලයේ සියලුම ගුරුවරුන් කැඳවා අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන බැවින් ද මෙම පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකාර හලා/ආර්/ අත්තංගනය කනිෂ්ඨ විද්‍යාලයේ හිටපු විදුහල්පති සමන් පුෂ්පකුමාර යන අය හට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

තවද, ඉහත කී <u>බණ්ඩාර</u> එ. <u>වික්‍රමසිංහ</u> [(1995) 2 Sri L.R. 167] නඩුවේ දී, කුලතුංග විනිසුරුතුමා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, මෙවැනි පහරදීම් සම්බන්ධ සිදුවීමක දී අධිකරණය විසින් සුදුසු සහන ලබා දීම තුළින් පෙත්සම්කරුට සිදුවූ අවමානය ඉවත් කර ඇති බවටත්, ඔහුගේ අභිමානය යළි ගොඩනඟා ඇති බවටත් සහතික කළ යුතු බවත්, එමගින් ඔහුගේ අනාගත මානසික යහපැවැත්ම යම්තාක් දුරකට හෝ තහවුරු වනු ඇති අතර, ඉදිරි ජීවිතයට එය අතිශය වැදගත් වනු ඇති බවත් ය. ("This court must by granting appropriate relief reassure the Petitioner that the humiliation

guarantee his future mental health which is vital to his advancement in life.") ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළව වින්දිත දරුවා හට සිදුව ඇති පහරදීම හේතුවෙන් ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුව ඇති බව හඳුනාගෙන ඇති බැවින්, ඒ සඳහා සුදුසු සහන සැලසීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ද සිදු කළ යුතුව ඇත.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් රුපියල් එක් ලක්ෂය (රු.100,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවාට වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. මෙම සිදුවීමට අදාළව හලාවත මහේස්ත්‍රාත් අධිකරණයේ අපරාධමය වරදක් සම්බන්ධව 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අයට එරෙහිව නඩුවක් පවතින බව වාර්තා වන හෙයින් ඒ සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කරනු නොලැබේ. එහෙත් මෙම සිදුවීමට අදාළව වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පවත්වා ඇති බවට 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කරන ලද පරීක්ෂණය විනය පරීක්ෂණයක් නොව මූලික විමර්ශනයක් පමණක් බව පෙනී යන බැවින්, පරිපාලනමය වශයෙන් 1 වන වගඋත්තරකාර බී.ඒ. පැතුම් සඳරුවන් යන අය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයන්ට පරිබාහිරව කටයුතු කරමින් වින්දිත පාර්ශවය වන ඒ.එම්. උමිඳු පේෂල යන දරුවා හිංසනයන්ට ලක් කිරීමට අදාළව පරීක්ෂණයක් පවත්වා සුදුසු විනය පියවර ගැනීමට වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 09 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව 1 වන වගඋත්තරකරු සහ වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙහි පළමුවන නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම්, පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් අනෙක් පිටුවෙහි ඇත. ⟶

පිටපත් -:

01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - කරුණු දැනගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ප්‍රධාන ලේකම්, - ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය,
පළමු මහල, පළාත් සභා සංකීර්ණය,
කුරුණෑගල.

04. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කරුණු දැනගැනීම සඳහා
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
නුවර පාර, කුරුණෑගල.